# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2002/32 - 2017 ජනවාරි මස 18 වැනි බදාදා - 2017.01.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, එකී පනතේ 139 වන වගන්තිය ප්‍රකාරව එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබුවා වූ විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු වූ ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වා ඇති (2016 අගෝස්තු 09 දින අංක 1979/20 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ නියමය මගින් අවසන්වරට සංශෝධිත) 2006 ජූනි 09 දින අංක 1448/27 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයේ උපලේඛනය එහි I වන තීරයේ "විද්‍යා පීඨය" යන අයිතමයට හා ඊට අනුරූප වන්නා වූ උපලේඛනයේ II වන තීරයේ සටහන්වලට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතම සහ සටහන් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

| "*I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| තාක්ෂණ පීඨය | 1. මෙවලම් හා ස්වයංක්‍රීය තාක්ෂණ අංශය. |
| | 2. පාරිසරික තාක්ෂණ අංශය. |
| | 3. කෘෂිකාර්මික තාක්ෂණ අංශය. |
| | 4. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය. |
| හෙද පීඨය | 1. මූලික විද්‍යා සහ සමාජ විද්‍යා හෙද අංශය. |
| | 2. මූලික (මූලධර්ම) හෙද අංශය. |
| | 3. සායනික හෙද අංශය". |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2016 දෙසැම්බර් මස 31 වැනි දින.
කොළඹ දී ය.

02 - 99

1A - PG 3345 — 508 (2017/01)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*